
# පේගිනස් කන්දේ අභිරහස



තිනුලි හේරත්

# ජෙගිනස් කන්දේ අභිරහස

තිනුලි හේරත්

**කර්තෘගේ වෙනත් කෘති**

**කිටී සහ පිටී**

**ජෙගිනස් කන්දේ අභිරහස**

© තිනුලි හේරත්

---

**ISBN: 978-624-206-590-8**

**පළමුවැනි මුද්‍රණය: 2023**

**කර්තෘ ප්‍රකාශනයකි.**

---

පිදුම

කුඩා කල සිටම

පොත් ලිවීමට සහ කියවීමට

මා දිරි ගැන්වූ

මාගේ ආදරණීය

අම්මාට සහ තාත්තාට

මේ පොත

සෙනෙහසින් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන

අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

එදින ලන්ඩන් නගරයට පැහැබර දිනයක් විය. හිරු හොඳින් පායාවිත් තිබුණේ ය. උදෑසන අවදි වූ ජෝන් ජනේලයේ තිර රෙද්ද ඇත් මැත් කර වටපිට බැලුවේ ය. ඒ තම යහළුවන් නිවසට පැමිණ ඇත්දැයි බැලීමට ය. ඔරලෝසුව දෙස බැලූ ඔහු මවිතයට පත්වූයේ ය. වේලාව නවයයි හතලිස් පහයි. දහය වන විට මිතුරන් පැමිණෙන බව පෙරදින ඔහුට ලිපියක් මගින් දන්වා තිබුණේ ය. හනි හනික තරප්පු පෙල බැස පහත මාලයට දිව ගිය ජෝන්ට උදෑසන ආහාරය පවා ගැනීමට නොහැකි විය. සිය මිතුරන් ගේට්ටුව අසලට විත් බයිසිකල් සීනුව නාද කළේ ය. මවට නොදැනී උදෑසන ආහාරය විසි කිරීමට ජෝන් තැත් කළේ ය. නමුත් එය අසීරු කාර්යයක් වූ හෙයින් සියලු ම ආහාර කෑමට ඔහුට සිදු වූයේ ය.

"අම්මා, අම්මා, යාලුවෝ ඇවිත් ඉන්නවා, මම යනවා බයිසිකල් සවාරියට." කියමින් ජෝන් නිවසෙහි ඉදිරිපස දොර විවෘත කළේ ය. තමන්ගෙ ප්‍රමාදවීම හේතුවෙන් කෝපාන්විත මුහුණින් සිටි මිතුරන් දෙස බැලූ ජෝන් "සුබ උදෑසනක් යාලුවනේ! පරක්කු වුණාට සමාවෙන්න." යැයි පවසමින් ගරාජයේ දොර විවෘත කළේ ය .

ඉන්පසු බයිසිකලය ගත් ජෝන් තම මිතුරන් සමඟ ජෙගිනස් කන්දට යාමට පිටත් වූයේ ය. ටික දුරක් ගියත් හෙම්බත් වූ ජෝන්ගේ මිතුරු ෆ්රැන් වතුර

බීම සඳහා බයිසිකලය නතර කළේ ය. එම නිසා අනිත් අයට ද ඔහු පැමිණෙන තෙක් සිටීමට සිදු වූයේ ය. නැවත ගමන පටන් ගත් ඔවුහු පැය තුනකට ආසන්න කාලයක් ගමන් කර දහවල් ආහාරය ගැනීමට තැනක් සෙවුවෝ ය. එය ඔවුන් සිතූ තරම් පහසු කාර්යයක් නොවී ය. බොහෝ වේලාවක් සෙවීමෙන් පසු ඔවුන්ට සුදුසු ස්ථානයක් හමුවූයේ ය. ඉතා ප්‍රණීත දහවල් ආහාරයක් ගත් ඔවුහු නැවත තම ගමන පටන් ගත්හ. දැඩි හිරු රශ්මිය හේතුවෙන් සවාරිය එතරම් සතුටුදායක නොවීය. නමුත් ඒ නිසාවෙන් තම බයිසිකල් සවාරියේ විනෝදය නැති කර ගැනීමට ඔවුන් කිසිසේත් ම කැමති නොවී ය.

ඔවුන්ට සවස් වීමට පෙර කන්දේ මඟකට යාමට හැකි විය. ඔවුන්ට නැවත නිවසට යාමට කාලය නැති හෙයින් රාත්‍රී කාලය කන්දේ ගත කිරීමට ඔවුන් සැමගේ තීරණය විය. රාත්‍රී නින්දට යාමට පෙර ඔවුන් ගිනිමැලයක් ගසා පරිසරය උණුසුම් කරගෙන රාත්‍රී ආහාර ගැනීමට සූදානම් වූහ. ඉතාම රසවත් ආහාර වේලක් රස විඳි ඔවුහු නින්දට ගියහ.

උදෑසනම අවදි වූ ජේරූන් අවශ්‍ය ආහාර පිසුවේ ය. රසවත් ආහාර වේලක් භුක්ති විඳ සියල්ලෝම කන්ද වටා ඇවිදිමින් ඉතා විනෝදයෙන් කාලය ගත කළහ. ඉන්පසු ඔවුහු නැවතත් සිය ගමන ආරම්භ කළහ. බොහෝ දුරක් ගමන් කිරීමෙන් පසුව වෙහෙස

නිවා ගැනීමට සියල්ලෝම ගසක් යට හිඳ කතාබස් කරමින් සතුටින් කාලය ගත කළහ. කෙටි ආහාරයක් ලෙස සැන්විච් දෙකක් එක් අයකුට එන ලෙස ඩික් බෙදා දුන්නේ ය. එක් අතට සැන්විච් එකක් ගත් බෙන් එක කටට එය ගිල දැම්මේ ය. එය දැක සැවොම සිනාසුණහ. ඔවුහු ටික වේලාවක් විනෝදයෙන් කාලය ගත කළහ. ඉන්පසු බෙන් නැගිට බයිසිකලේ ළඟට ගොස් බයිසිකල් කූඩයට අත් දමා ජින්ජර් බියර් බෝතල් හතරක් ගෙන මිතුරන් තිදෙනාට ද දුන්නේ ය. එය බී බඩකට පුරවා ගත් ළමෝ නැවත ගමන යාම සඳහා සූදානම් වූහ. ඉතා විනෝදයෙන් නැවතත් කන්ද නැගීම ආරම්භ කළහ. "අපරාදෙ ලෙඩීටත් මේ ගමන එන්න තිබුණෙ. කොහෙද ඉතින් එයාගේ අම්මා එන්න අවසර දුන්නෙ නැනේ." බෙන් දුක් මුසු මුහුණින් යුතුව කීවේ ය. "ඒකත් ඇත්ත තමා එතකොට අපිට එයාගෙ විහිලු කතා අහල විනෝද වෙන්නත් තිබුණා." ජෝන් ද කතාවට එක්වෙමින් කීය. "ඒක නෙවෙයි දැන් අද රැටත් අපිට කූඩාරම් ගහගෙන ඉන්න වෙයිද දන්නැනේ?" ෆ්රැන් කීවේ කතාව වෙන අතකට හරවමිනි. "ඔව් හැබැයි ඒකත් නියම වැඩේ නේ. අද රෑ වෙනකොට කන්ද මුදුනට වත් ළඟා වෙන්න පුළුවන් වෙයිද දන්නෑ" ජෝන් කීවේ ය.

මීදුම් මිටියාවත මැදින් ගිය ඔවුහු දහවල් ආහාරය ගැනීම සඳහා බයිසිකල් නතර කළහ. බෙන් බෑගයට අත දමා රෝල්ස් හා ලයිම් ජූස් බෝතල් කිහිපයක් ගෙන යහළුවෝ සමග බෙදා ගත්තේ ය. ඉන්පසු රාත්‍රී කාලය ගත කිරීමට තැනක් සොයමින් ඔවුහු කන්ද නැගීම ආරම්භ කළහ. කන්ද නැගීමේ දී හමුවන කුඩා ගල් කැට, විශාල ගල් කැට, මුල් ආදිය නිසා ඔවුන්ට කන්ද නැගීම පහසු නොවීය. එම නිසා වෙහෙස නිවා ගැනීමට ඔවුහු රසබර කතා කියමින් ඉදිරියට ගමන් කළහ.

කෙමෙන් කෙමෙන් රාත්‍රී කාලය එළඹෙමින් තිබුණේ ය. සීත සුළංවලින් ඔවුන්ගේ ගත පිබිදුනේ ය. රාත්‍රී කාලය ගත කිරීමට සුදුසු තැනක් ඔවුන්ට හමු වූයේ නැත. “මට හොඳටම මහන්සියි. අපිට තාම රෑ ගත කරන්න තැනක් හම්බ උනේ නැනෙ.” ඩික් දුක්මුසු මුහුණකින් යුතුව කෙඳිරුවේ ය. “ශ්... .....ශ්.... සද්ද කරන්න එපා. බලන්නකෝ අර කන්ද උඩ ලයිට් එළියක් පත්තු වෙනවා.” බෙන් කීවේ ය. “ඒක වෙන්න බැරි වැඩක් නේ. මේ පාළු කන්දෙ කිසිම හැල හොල්මනක් ඉන්න විදිහක් නෑ.” ඩික් පුදුමයෙන් මෙන් කීවේ ය. “අද රෑට අපිට ඒ ගෙදර නතර වෙන්න පුළුවන් වෙයිද දන්නෑ. අපි ගිහිල්ලා බලමුද?” ජෝන් විශ්වාසනීය හඬකින් කීවේ ය.

බොහෝ වෙහෙසක් දරා කන්ද මුදුනට නැගීමට ඔවුන්ට හැකි විය. ගේට්ටුව අසල තිබූ සීනුව ජෝන් නාද කළේ ය. නිවස තුළින් කිසිවෙක් පැමිණ ගේට්ටුව විවර කළේ ය. "ඔය ළමයි කවුද? මොකද මෙහෙ කරන්නේ?" ඔහු කලබලයෙන් මෙන් විමසා සිටියේ ය. "මහත්මයා අපි මේ පැත්තෙ නිවාඩු කාලය ගත කරන්න ආවෙ. අද රෑට විතරක් අපිට මෙහෙ නවාතැන් ගන්න බැරිවෙයිද?" ජෝන් ආචාරශීලී ලෙස විමසුවේ ය. නමුත් එයින් කෝපයට පත් වූ ඔහු "මෙහි නවාතැන් නෑ. දැන්මම මෙහෙන් යනවා." යැයි ඉතා තදින් කීවේ ය. සිහින බොඳ වූ ළමුන් එම නිවස අසල කැලෑවට ගියේ ය. "අපි ඒ මනුස්සයට තරහ යන්න දෙයක් කිව්වෙ නෑනෙ." නිවස අසලින් ගිය ෆ්රෑන් නොසන්සුන් හඬකින් කීවේ ය. "හරි, හරි, දැන් ඒකට කමක් නෑ.. අද අපි මෙතන කූඩාරම් ගහමු." බෙන් කීවේ ෆ්රෑන්ගේ කෝපය නිවීමට ය.

සියල්ලෝම එයට එකඟ වී කූඩාරම සකස් කර රාත්‍රී ආහාර ගැනීමට සූදානම් වූහ. ඔවුන්ගේ අවාසනාවට මෙන් ඉතිරිව තිබුණේ බිස්කට් පැකට් දෙකක් සහ ලයිම් ජූස් බෝතල් කිහිපයක් පමණි. "අද රෑට නම් අපිට මේ ටික ඇති වෙයි. අපි හෙට උදේට මොනවහරි කන්න හොයාගන්න බලමු." ජෝන් කීවේ ය. සියල්ලෝ ම රසබර ආහාර වේලක් ගත්තාහ. කෑම කා අවසන් වූ විට ඔවුන් විනෝදයෙන්

කතාබස් කරන්නට විය. "ඇයි අර මනුස්සයා නිකම් බොරුවට අපිට කෑගැහුවේ?" ඩික් සැකයෙන් මෙන් ඇසුවේ ය. "අනේ මන්දා, හැබැයි මට නම් හිතෙන්නේ මෙතන මොකක් හරි හොර රහස් වැඩක් කෙරීගෙන යනවා." ජෝන් ද කීවේ සැකයෙනි. "මේ ගැන හෙට බලමු, දැන් හැමෝම නිදාගමු." ඩික් කීවේ ය.

"සුභ උදෑසනක්! හැමෝම ඇහැරිලා, මං විතරද කොහෙද දැන් ඇහැරුණේ." ෆ්රැන් ඇනුමක් හරිමින් කීවේ ය. "අපෝ නෑ මේ කම්මැලියා තාම නිදි." ජෝන්, ඩික් දෙසට අත දිගු කරමින් කීවේ ය. "ඒක නෙවෙයි අපි දැන් උදේට කන්නේ කොහොමද? මේ කන්ද නැගලා බහිනකොට අපි මැරිලා ඉදී. මේ කන්ද උඩ මොන කඩද?" ෆ්රැන් කීවේ ය. "කමක් නෑ, දැන් අපිට කරන්න තියෙන්නේ එකම දෙයයි. මේ ගෙදරින් කෑම ටිකක් ඉල්ල ගමු." කිරීමට කිසිත් නැති හෙයින් බෙන් කීවේ ය. "ඔයාට පිස්සුද? ඔයා හිතනවද මේ ගෙදර මිනිස්සු අපිට කෑම දෙන්නෙ කැමති වෙයි කියලා." ෆ්රැන්, බෙන්ගේ කතා පිළිබඳ විශ්වාසයක් නොතබා කීවේ ය. "දැන් අපිට වෙන කරන්න දෙයක් නෑනේ." බෙන් කීවේ ය. "අපි එහෙම කරමු." ජෝන් කීවේ ය.

සියල්ලෝම මුහුණ කට සෝදා ලෑස්ති වී එම නිවසට ගියහ. ගේට්ටුව අසල වූ සීනුව ජෝන් නාද

කළේ ය. එවිට ගැහැණු කෙනෙක් පැමිණ ගේට්ටුව විවෘත කළා ය. “ඔය ළමයි මේ පළාතට අලුත් අය වෙන්න ඕන. මොකද්ද මගෙන් වෙන්න ඕන?” ඇය ප්‍රියමනාප ලෙස විමසුවාය. “අපි බයිසිකල් සවාරියකට ජෙගිනස් කන්දට එන්න හිතුවා. හැබැයි අපි හිතුවේ නෑ මේ කන්දේ එක ගෙදරක් වත් තියෙනවා කියලා. හදිස්සියේ ම අපේ කෑම ඉවර වුනා. අපිට කෑම ටිකක් ඉල්ලගන්න පුළුවන් වෙයිද?” ජූලියන් ආයාචනා කළේ ය. “මම මේ ගෙදර කුස්සි අම්ම, මම අපේ ගෙදර ඩෙක්ලින් මහත්තයාගෙන් අහල කියන්නම්.” යැයි කියා ඇය ආපසු හැරී යාමට සැරසුනා ය.'' ඒ සමගම ඩික් ඇයව වළක්වාලමින් “ඔයා ඔය ඩෙක්ලින් මහත්තයා කිව්වෙ මේ ගෙදර ඉන්න කළු, උස, ටිකක් කෙට්ටු අර නපුරු කෙනාද?” යැයි ඩික් විමසා සිටියේ ය. “ඔව් එයා නපුරුයි තමා, ඒ වගේම ඔය ළමයා කිව්වා වගේම ටිකක් විතර කෙට්ටුයි, උසයි, හැබැයි ඔය ළමයා කොහොමද ඒක දන්නේ?” ඇය පුදුමයෙන් විමසා සිටියා ය. “අපෝ මොකද අපි නොදන්නේ, ඊයේ රෑ අපි නවාතැන් ඉල්ලන් එද්දී අපිට ඉඩ නෑ කියලා යන්න කිව්වා.” ජෝන් එම සිදුවීම ඇට විස්තර කරමින් කීවේ ය. “ඔව් එයා එහෙම තමා, ඒත් මම අහල බලන්නං.” ඇය පැවසුවා ය. කිරීමට කිසිත් නැති හෙයින් ළමයි සියලු දෙනාම ඊට එකඟ වූහ.

කුස්සි අම්මා නිවසට ගොස් බලන විට ඇට දිස්වූයේ කවිච්චියේ ගොරවමින් නිදා සිටින ඩෙක්ලින් මහත්මයා ය. "මම දැන් ඩෙක්ලින් මහත්මයා ඇහැරෙන්න කලින් අර අසරණ ළමයින්ට කෑම ටිකක් ගෙනිහින් දෙන්න ඕන." ඇය තමාටම කියා ගත්තා ය. "අනේ අපිට කෑම ටිකක් හම්බුනොත් හොඳයි. නැත්තං අපි මේ කන්ද උඩ මැරිල ඉදී." යැයි සිතමින් ළමයි කුස්සි අම්මා එනතුරු බලපොරොත්තු සහගතව බලා සිටියහ. ඔවුන්ගේ බලාපොරොත්තු ඉෂ්ට වූවාක් මෙනි. කුස්සි අම්මා ආහාර සහිත මලු තුන හතරක් පොදි බැදගෙන පැමිණියා ය. ළමුන් සියලු දෙනාම එය දැක මහත් ප්‍රීතියට පත් විය. බොහෝ වරක් ස්තූති කිරීමෙන් පසු බෙන් තම සාක්කුවට අත දමා පවුම් තුනක් පමණ ඇයට ලබාදීමට සැරසුණේ ය. නමුත් ඇය එය ප්‍රතික්ෂේප කළා ය. ඉන්පසු නැවතත් ඇයට බොහෝ වරක් ස්තූති කල ළමුන් ඔවුන්ගේ කඳවුර බලා පිටත් විය.

ඉන්පසු කඳවුරට ගොස් ඔවුන්ට ලැබුන කෑම මලු දිගහැරි ඔවුහු පුදුමයට පත් වූයේ ය. ඒ ඔවුන්ට අවශ්‍ය ප්‍රමාණයට වඩා ආහාර ලැබී තිබීම නිසා ය. ලයිම් ජූස් බෝතල් අටක්, සැන්විච් පාර්සල් තුනක් සහ බිස්කට් පැකට් කිහිපයක් ආදී දේ තිබුණේ ය. එයින් කෑම වර්ග කිහිපයක් පමණක් ගෙන ඉතිරිය පසුවට

කෑමට ගැනීමට ඔවුහු තීරණය කළහ. ඉන්පසු සැවොම කතාබස් කරමින් කාලය ගත කළහ.

"මට ආසයි දැන් මේ කන්ද උඩ ඉන්න හින්දා වුට්ටක් ඇවිදලා බලන්න." ජෝන් යෝජනා කළේ ය. එම අදහසට සැවොම එකඟ වූහ. ඉන්පසු සියල්ලෝම නිදහසේ ඇවිදිමින් කල් ගත කළහ. "දැන් හොඳටම දවල් වෙලා, අපි දැන් දවල්ට කන්ට යමුද? මොකද දැන් අපි පැය ගණනක් තිස්සේ ඇවිද්දානේ. මට හොඳටම බඩගිනියි." ෆ්රැන් කීවේ ය. "එහෙනම් අපි දැන් යමු." බෙන් ද කීවේ ය. ළමෝ ලයිම් ජූස් බී සැන්විච් කෑහ. "අම්මෝ මට දැන් නැගිට ගන්නත් බෑ වගේ." ජෝන් කීවේ ය. "ඔයා මොනවා කිව්වත් මට කමක් නෑ. මටනම් අද හවසම ගිහින් අර කුස්සි අම්මගෙන් දැනගන්න දෙයක් තියෙනවා." ඩික් කීවේ ය. "ඒ මොකක් ද?" ෆ්රැන් පුදුමයෙන් මෙන් විමසා සිටියේ ය. "මට හිතෙනවා මෙතන මොකක් හරි අභිරහසක් වෙනවා කියලා. මට ඒක ගැන දැනගන්නත් ඕන. තව මේ පළාත ගැන විස්තර ටිකක් දැනගන්නත් ඕන." ඩික් කීවේ ය. සැවොම එකඟ වූහ. "මටත් ඕකමයි හිතුණේ ඩික්, මෙතන ලොකු අබිරහසක් තියෙනවා. මෙච්චර මේ පළාතේ ඉඩ තියෙද්දිත් මේ කන්ද මුදුනෙම ගේ හදාගත්තේ ඇයි?" බෙන්ද කීවේ සැකයෙනි. "අපි දැන් යමු, මොකද

ගොඩක් හවස් වුණොත් අපිට කළුවරේ තමයි එන්න වෙන්නේ.'' ඩික් කීවෙ ය.

''අපි දැන් ගිහිල්ලා කුස්සි අම්මගෙන් මොනවද අහන්නේ?'' ගමන යන අතරතුරේදී ෆ්රෑන් විමසුවේ ය. ''වෙන මොනවා අහන්නද? අපි ඉස්සෙල්ලාම එයාගෙන් එයාගෙ විස්තර ටිකක් අහලා බලමු. ඊට පස්සෙ මේ පළාත ගැන අහලා ඒ ගෙදර අය ගැනත් අහගනිමු.'' ජෝන් පිළිතුරු වශයෙන් කීවේ ය. ''හරි ඕන්න දැන් අපි ගේ ළඟටම ඇවිත් ඉන්නේ. මේ වෙලාවේ ඩෙක්ලින් මහත්මයා ගෙදර නැතුව ඇති කියලා මම හිතනවා.'' ජෝන් බියෙන් කීවේ ය. ''හැබැයි අපි යනකොට බැරිවෙලා හරි ඩෙක්ලින් මහත්මයා ගෙදර හිටියොත් අපිට මොනවා වෙයිද දන්නෙ නෑ.'' ඩික් ද කීවේ බොහෝ සේ බියපත්ව ය.

නිවස අසලට ළඟා වූ ඔවුහු අසල වූ ගේට්ටුවේ තිබූ සීනුව නාද කළහ. කිසිවෙකුත් පැමිණියේ නැති නිසා ටික වේලාවකට පසු නැවත වරක් ෆ්රෑන් සීනුව නාද කළේ ය. එවිටත් කිසිවෙකු පැමිණියේ නැත. ''ගෙදර කවුරුත් නැද්ද දන්නෑ.'' ජෝන් කීවේ ය. ''කමක් නෑ පිටිපස්සේ ගේට්ටුවක් නැනෙ. අපි පිටිපස්ස පැත්තෙන් ගිහිල්ලා දොරට තට්ටු කරලා බලමු.'' ඩික් යෝජනා කළේ ය. සියල්ලෝම ඊට එකඟ වූහ. ෆ්රෑන් පිටුපස දොර අසලට ගොස් තට්ටු කළේ ය. එවිට කුස්සි අම්මා විත් දොර ඇරියා ය.

"මේ අර ළමයි නේද?" කුස්සි අම්මා කීවා ය. "අපි තමා. ඔයාට ඇහුනෙ නැද්ද අපි ගේට්ටුවෙ සීනුව නාද කළා?" ජෝන් විමසා සිටියේ ය. "ආ.... ළමයො මම කුස්සියේ හිටියේ. ඒ හින්දා ඇහුනෙ නැහැ." කුස්සි අම්මා පිළිතුරු දුන්නා ය. "ඇයි ගෙදර වෙන කවුරුත් නැද්ද?" බෙන් ඇසුවේ ය. "නෑ අද මම විතරයි ගෙදර ඉන්නෙ. අනිත් අය ගෙදර නෑ." කුස්සි අම්මා පැවසීය. "ළමයි මේ හදිසියේම ඇයි? කෑම ඉවර වුණාවත්ද?" ඇය විමසා සිටියා ය. "අපොයි නෑ කෑම නම් තව ගොඩක් තියනවා. අපි මේ පොඩි විස්තර ටිකක් දැනගන්න ආවේ." ජෝන් කීවේ ය. "හරි ඇතුලට එන්නකෝ." කුස්සි අම්මා පැවසුවා ය. "දැන් එහෙනම් කියන්නකො කාරණේ." කුස්සි අම්මා කීවා ය. බෙන් ඉඳගනිමින් මෙසේ කීවේ ය. "අපට කියන්න පුළුවන් ද මේ පළාත ගැනයි මේ ගෙදර ගැනයි විස්තර ටිකක්?"

ඉන්පසු පැය තුනකට අධික කාලයක් සියල්ලෝම කතාබහේ යෙදුනහ. ටික වේලාවකට පසු "මේ ගෙදර ගැන කිව්වොත් මෙහෙ ඉන්නේ ඩෙක්ලින් මහත්මයයි, ඒ නෝනයි, අවුරුදු විස්සක විතර කොලු ගැටයකුයි. ඩෙක්ලින් මහත්මයා ගැන නම් කියල වැඩක් නැහැ, මහම මහ වංචාකාරයෙක්. හැබැයි ඒ නෝනා නම් හරිම හොඳයි. මට තියෙන ලොකුම ප්‍රශ්නෙ තමයි මේ වගේ වංචාකාරයෙක් ළඟ

වැඩ කරන්න උනා එක. මේකත් හොදට අහගන්න, එයා හොරෙක්, පොලිසියෙන් එයාව හොයනව. ඒකයි එයා අද ගෙදර නැත්තෙ. එයා පැනලා ගියා මොකද එයාව අද දවස පුරාම පොලිසියෙන් හොයනවා කියලා ආරංචි වුණා.'' කුස්සි අම්මා කීය. ''මටත් ඕකම කලින් හිතුනා, කවුරුවත් ගෙදරට එනවට කැමති නෑ, මේ කන්දක් උඩ ගෙදරත් හදාගෙන.'' ජෝන් කීවේ ය. ''ඉතින් ඇයි ඔයා මේ ගැන පොලීසියට කිව්වේ නැත්තෙ?'' බෙන්, කුස්සි අම්මගෙන් ඇසුවේ ය. ''මම මේ ගැන පොලීසියට කිව්වොත් මට රස්සවක් නැති වෙනවා. මට ඉන්න හිටින්න තැනක් නැති වෙනවා. ඔයාලා මං මේ කිව්ව දේ කාටවත් කියන්න එපා.'' කුස්සි අම්මා තවදුරටත් කීය. ''හරි, හරි, අපි මේවා කාටවත් කියන්නෑ. දැන් රෑ බෝ වේගෙන එනවා. අපි දැන් යන්නම්, පස්සේ හම්බවෙමු.'' සියල්ලෝම එකට කීහ. ''හරි ළමයිනෙ පරිස්සමින් ගිහින් එන්න.'' කුස්සි අම්මා කීය.

''හරි දැන්නේ තේරුණේ මට මෙතන මොකක්ද වෙන්නෙ කියලා.'' කඳවුරට යන අතරතුරේදී බෙන් කීවේ ය. ''ඒක තමා අපි කල් දාන්නේ නැතුවම මේගොල්ලෝ ව පොලිසියට අල්ලලා දෙමු.'' ජෝන් කීවේ ය. ''ඔව් ඒක හොඳයි. නැත්නම් මේගොල්ලෝ පැනලා යන්න පුළුවන්.'' මෙතෙක් වෙලාවක් නිහඬව සිටි ෆ්රෑන් කතාවට

එක්වෙමින් කීවේ ය. “ඔව්, ඔව්, අපි එහෙම කරමු.” ඩික් ද කීවේ ඊට එකඟ වෙමිනි. “දැන් රෑ බෝ වෙගෙනත් එනවා. අපි කාලා නිදාගෙන හෙට උදේම හොඳ සැලසුමක් ගහමු.” ජෝන් කීවේ ය. සැවොම රසබර ආහාර වේලක් භුක්ති වින්දෝ ය. “අපිට මෙහෙම කන්න හම්බ උනේ අර කුස්සි අම්මාට පින් සිද්ද වෙන්න තමා.” ජෝන් කීවේ සතුටිනි. “අපි දැන් එහෙනම් නිදාගමු.” ඩික් කීවේ ය. නොබෝ වේලාවකින් නින්ද ඔවුන් කරා පැමිණියේ ය.

උදෑසනම අවදිවූ ෆ්රෑන් මලු වලින් ආහාර එළියට ගෙන පිළියෙල කළේ ය. ඉන්පසු ඔහු සියල්ලෝම අවදි කර ආහාර ලබා දුන්නේ ය. සියල්ලෝම ආහාර ගෙන කතාබස් කරමින් කාලය ගත කළහ. “අපි මෙහෙම කරමු. අපි අද රෑට යමු ඩෙක්ලින් මහත්මයාගේ ගෙදර, ඒ ගිහිල්ලා අපි එයාව පොලිසියට අල්ලලා දෙමු.” ජෝන් කීය. සැවොම ඊට එකඟ වූහ. “අපි දැන් ඇවිදින්න යමුකෝ, මට හරි කම්මැලියි.” ෆ්රෑන් කීවේ ය. සියල්ලෝම එහෙ මෙහෙ ඇවිදිමින් විනෝදයෙන් කාලය ගත කළහ. “අපේ වාසනාවට වෙන්න ඇතිනේ මේ දවස් වල කාලගුණය හොඳ.” බෙන් ඇවිදින අතරතුරේදී කීය.

“අම්මෝ..... මට නම් දැන් හොඳටම මහන්සී. අපි කඳවුරට යමුකෝ” ඩික් මලානික හඬකින් කීවේ ය. “අප්පෝ..... ඩික් මොනවද අපි එච්චර දුරක්

ගියෙත් නෑ, ඔයාට මහන්සියි.'' ජෝන් උපහාසාත්මකව කීවේ ය. ''ඒත් ඔයාලට මහන්සි නැති උනාට මට මහන්සියි.'' ඩික් තරමක් තදින් කීවේ ය. ''හරි, හරි, අපි එහෙනම් යමුකෝ.'' ජෝන් සිනාසෙමින් කීවේ ය. ඔවුහු කඳවුර බලා ගමන් කරමින් විනෝද කතා බස් කළහ. ''ඒක නෙවෙයි මටනම් ඉවසිල්ලක් නෑ අද අර වංචාකාර ඩෙක්ලින්ව පොලිසියට අල්ලලා දෙනකං.'' බෙන් නොඉවසිල්ලෙන් කීවේ ය. ''හරි ඔන්න එහෙනම් අපි දැන් ආවා නේ. මට යකෙක් කන්න බඩගිනියි. කෑම ටික ඉක්මනට එළියට ගන්නකෝ ෆ්රැන්.'' ඩික්, බෑගය තුළට අත දමා ගෙන කෑම සොයනා ෆ්රැන්ට කීවේ ය. සියල්ලෝම රසවත් ආහාර වේලක් භුක්ති වින්දහ.

''අම්මේ මටනං නැගිට ගන්නවත් බෑ.'' බෙන් කීවේ සිනාසෙමිනි. ''වෙලාවට අපෙ තාත්ත මට ෆෝන් එකක් දීලා තිබ්බෙ.'' ෆ්රැන් කීවේ ය. ''ඒ හින්ද අපිට පුළුවන් අද රෑට ඩෙක්ලින් මහත්මයාගේ ගෙදර ගිහින් මේ ගැන පොලිසියට කෝල් කරල කියන්න.'' ෆ්රැන් ඔහුගේ සැලැස්ම පෙන්වමින් කීවේ ය.

''අපි දැන් යමුකෝ ඩෙක්ලින් මහත්මයාගේ ගෙවල් පැත්තේ, එතකොට අපිට පුළුවන් එයා ගෙදර ඉන්නවද කියලා දැනගන්න. නැත්තන් අපි බොරුවට එයාලගේ ගෙදර ගිහිල්ලා වැඩක් නැනෙ.'' ජෝන්

කීවේ ය. "එහෙනම් අපි යමුකෝ." ඩික් ද කීවේ ඊට එකඟ වෙමිනි. සියල්ලෝම ඩෙක්ලින් මහත්මයාගේ නිවස බලා පිටත් වූහ. "දැන් හැමෝම සද්ද කරන්න එපා. ඩෙක්ලින් මහත්මයාට ඇහුනොත් අපි මේ පැත්තේ ඉන්නවා කියලා එයා අපිව ඉතුරු කරන එකක් නැහැ." ජෝන්, ඩෙක්ලින් මහත්මයගෙ නිවසට ළංවන විට සියලු දෙනාටම හෙමින් කීවේ ය.

ඔවුහු ගේට්ටුව අසල වූ විශාල පඳුරක් යට සැඟවී සිටියහ. ටික වේලාවකට පසු ගේට්ටුව එකවරම විවෘත විය. ළමෝ බොහෝ සේ බියපත් වූහ. නමුත් එයින් පිටතට පැමිණියේ කුස්සි අම්මා ය. ඇය ගමනක් යාමට සැරසී ඇති බව පෙනුනා ය. එවිට ඩික් වහාම නැඟිට ඇය අසලට ගොස් ඇයගෙන් ඩෙක්ලින් මහත්මයා අද දින නිවසේ සිටිනවාදැයි විමසා, ඔවුන්ගේ සැලසුම ඉදිරිපත් කර, ඔහු මිතුරන් සමඟ ආ බව පැවසුවේ ය. "කුස්සි අම්මා කිව්ව අද දවස ම ඩෙක්ලින් මහත්මයා ගෙදර කියලා, එයා ආයෙ කිව්වා අද රෑට එයාට පුළුවන් උපරිමෙන්ම අපිට උදව් කරනවා කියලා. තව එයා අතුගාන කොට ඩෙක්ලින් මහත්මයාගේ ඇඳ යට බෑග් එකක හොර සල්ලි වගයක් තිබිල හම්බ වෙලා. එයා මට ඔක්කොම කිව්වා. දැන් අපිට ඒ හින්දා ගොඩක් ලේසියෙන් මේ වැඩේ කරගන්න පුලුවන්." ඩික් නැවත පැමිණ සිය මිතුරන්ට කීවේ සතුටිනි. "දැන් අපිට සාක්ෂිත්

තියෙනවානේ. ඒ හින්දා තවත් හොඳයි.'' ජෝන් ද කීවේ ය. ඉන්පසු ඔවුන් සියල්ලෝම නැවත කඳවුර බලා ගියහ.

''හරි එහෙනම් දැන් අපි ලෑස්ති වෙමු. අද රෑට යන්න එපැයි.'' බෙන් කඳවුරට ගිය පසු කීවේ ය. සියල්ලෝම ඊට එකඟ වී සූදානම් වූහ. ''අපි හරියටම හවස 06:00 ට ගිහින් අර පඳුර ළඟ හැංගිලා ඉන්න ගමන් පොලිසියට කෝල් එකක් ගමු.'' ෆ්රැන් කීවේ ය. නොදැනීම පැය හතරක පමණ කාලයක් ගෙවී ගියේ ය. ''දැන් හයට ළඟයි, ඔයාලා අවශ්‍ය දේවල් ලෑස්ති කර ගත්තා නේද? එහෙනම් දැන් අපි යමු.'' ජෝන් කීවේ ය.

සියල්ලෝම ගොස් ගේට්ටුව අසල වූ විශාල පඳුර ළඟ සැඟවී සිට පොලිසියට දුරකථන ඇමතුමක් ලබා දුන්හ. ''හෙලෝ, මේ පොලිස් ස්ථානය ද? අපි සැක කරනවා මේ පැත්තෙ තියෙන පෙගිනස් කන්දේ හොර සල්ලි අච්චු ගහන ජාවාරමක් කෙරීගෙන යනවා කියලා. ඒ ගැන දැනුම් දෙන්න තමයි කතා කළේ. ඔයාලට මේ දැන්ම එන්න පුලුවන්ද?'' ජෝන් විමසා සිටියේ ය

ටික වෙලාවකට පසු ඩෙක්ලින් මහත්මයා නිවස ඉදිරිපසට පැමිණියේ ය. එවිට ඔහුට දිස්වූයේ කඳු පල්ලේ සිට ඉහළට එන පොලිස් වාහනයයි. ඔහු එය දැක තිගැස්සුණේ ය. ඉන්පසු වහා නිවසට

දිවගොස් හොර සල්ලි බෑගය ද සමඟ පැන යාමට තැත් කළේ ය. එවිට ළමුන් පැන ඔහුගේ අත් දෙක ගෙන පිටුපසට බැඳ, කට රෙදි කඩකින් බැන්දේ ය. ඉන්පසු පොලිස් වාහනය ඔවුන් සිටි ස්ථානයට පැමිණියේ ය. පොලිස් නිලධාරීහු ළමුන්ගේ ක්‍රියාව අගය කළහ. “මීට පස්සේ මේ වගේ වැඩ කරද්දි පරිස්සම් වෙන්න ඕන. හරිද?” එක පොලිස් නිලධාරියෙක් ළමුන්ට කීවේ ය.

නිමි



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

“දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට ,

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01